**ශීර්ෂය 101 - බුද්ධශාසන හා වයඹ සංවර්ධන අමාත්‍යාංශය**

**------------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**1.1 මතය**

**------**

බුද්ධශාසන හා වයඹ සංවර්ධන අමාත්‍යාංශයේ 2019දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව බුද්ධශාසන හා වයඹ සංවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 29 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයටඅදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021ජනවාරි 11 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එමමූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට බුද්ධශාසන හා වයඹ සංවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **මතයසඳහාපදනම**

**--------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**----------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍යප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරීසහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී.මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහාඅවස්ථාවෝචිතවඋචිතවිගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.
- අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.5 **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

**-----------------------------------------------**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය හා 38 වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාලවමූල්‍ය ප්‍රකාශන පිළිබඳවමා විසින් කරතිබූනිර්දේශ ක්‍රියාත්මකකර තිබුණි.

1.6 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**----------------------------------------**

1.6.1 **නීති, රීතිහාරෙගුලාසිවලටඅනුකූලනොවීම**

**------------------------------------------------**

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| **නිරීක්ෂණය** | | | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | **නිර්දේශය** | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 396(ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නිකුත් කර මාස 7 ත් මාස 17 ත් අතර කාලයක් ඉකුත්වූ එකතුව රු.210,053 ක චෙක්පත් 11ක් සම්බන්ධයෙන්මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 396(ඈ) ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලනචක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශය සතුව සංචිත වාහන16 ක් පැවති අතර එම වාහනවල දැවෙන ඉන්ධන සම්බන්ධ පරීක්ෂාවක් සිදුකල, බවට සාක්ෂි ඉදිරිපත් නොවිය. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතුකළයු තු විම. | 2019 වර්ෂයේදි ඉන්ධන පරික්ෂා කිරිම සිදු කළද, විධිමත් කමිටුවක අධික්ෂණය යටතේ එය සිදුනොවූ බැවින් 2020 වර්ෂය සඳහා කමිටුවක් පත්කර පරික්ෂාවන් සිදු කරමින් පවති. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් පුනරාවර්තන වැය විෂයයන් 13 ක් හා ප්‍රාග්ධන වැය විෂයයන් 14 ක් සඳහා අවශ්‍ය මුළු ප්‍රතිපාදන ලෙස රු.1,930,944,346 ක් සලසා ගෙන තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට මුළු ප්‍රතිපාදනයෙන් රු.955,929,333 ක් හෙවත් සියයට 13 සිට සියයට 100 දක්වා වූ පරාසයකට අයත් ප්‍රතිපාදන ඉතිරිකර තිබුණි. | වර්ෂයේ අවශ්‍යතාවයක් නිසි පරිදි පුරෝකථනය කර අරමුදල් ප්‍රශස්ත මට්ටමින් උපයෝජනය කළ යුතුවීම. | අයවැය චක්‍රලේඛ 07/2019 හා 04/2019 අනුව වියදම් කළමනාකරණය කිරීමට සිදුවීම හා අක්මුදල් ප්‍රමාණවත්ව නොලැබීම නිසා ප්‍රතිපාදන ඉතිරිවීමක් සිදු විය. |

### 2.2 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් සැසඳුම් ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සේවය හැරගිය සේවකයෙකුගෙන් සහ විශ්‍රාම ගිය සේවකයෙකුගෙන් අයවිය යුතු රු.199,210 ක් වූ ණය ශේෂ වර්ෂ 2 ත් වර්ෂ 6 ත් අතර කාලයක සිට පැවත එන අතර එම ණය ශේෂ මෙතෙක් අයකර ගෙන නොතිබුණි. | ණය මුදල් අයකර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතු වීම. | විශ්‍රාම ගිය සේවකයාට ගෙවීමට නියමිත පාරිතෝෂික මුදලෙන් මෙම ණය මුදල අඩු කිරීමට දන්වා ඇති අතර අනෙක් සේවකයාගේ ණය මුදල 2021 වර්ෂයේදී අයකර ගැනීමට නියමිතව පවතී. |

**2.3** **බැරකම් හා බැදීම්වලට එළඹීම**

**---------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 94 (1) ප්‍රකාරව කිසිම හේතුවක් මත ප්‍රතිපාදන මුදල ඉක්මවා බැරකම් සඳහා නොබැඳිය යුතු වුවත්, ඊට පටහැනිව අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයේදී වැය විෂයන් 5 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් ඉතිරිය වූ රු.226,339 ක් ඉක්මවා රු.814,434 ක බැරකම්වලට එළඹ තිබුණි. | මුදල් රෙගුලාසි 94 (1) ප්‍රකාරව ප්‍රතිපාදන සීමාව තුල වියදම් හෝ බැදීම් ඇති කර ගත යුතු වීම. | මෙම බැරකම් අත්‍යාවශ්‍ය වියදම් සඳහා දරන ලද වියදම් වේ. |
| (ආ) | 2019 දෙසැම්බර් 3 දිනැති හා 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.4 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බැදීම් හා බැරකම් භාණ්ඩාගාරය විසින් නිකුත් කරනු ලබන බැදීම් හා බැරකම් ප්‍රකාශය සමඟ සැසඳී තිබිය යුතු වුවත් , අමාත්‍යාංශයට අදාල බැදීම් හා බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශන අනුව රු.62,715,395 ක් හා භාණ්ඩාගාර ලේඛන අනුව රු.271,620,205 ක් වූයෙන් රු.208,904,810 ක වෙනසක් නිරීක්ෂණය විය. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු විම. | මෙම බැරකම් දිස්ත්‍රික් ලේකම් කාර්යාල මඟින් සෘජුවම අත් මුදල් අවශ්‍යතා දක්වා මහා භාණ්ඩාගාරයට යොමු කිරීම හේතුවෙන් එම බැරකම් සනාථ කර ගැනීමට ප්‍රමාණවත් කාලයක් නොතිබීම මේ සඳහා හේතුවිය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ස්වාමීන් වහන්සේලා වෙනුවෙන් සෞඛ්‍ය ආරක්ෂණ වැඩ පිළිවෙලක් ලෙස 'බුදුපුත් සුරක්ෂා' නමින් සෞඛ්‍ය ආධාර වැඩසටහනක් සමාලෝචිත වර්ෂයේදී ආරම්භකර තිබූ අතර ඒ යටතේ භික්ෂූන් වහන්සේලා 8,515 ක් ලියාපදිංචි කරගෙන තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට පළාත් 9 ආවරණය වන පරිදි මෙම වැඩසටහන සම්බන්ධ උත්සව පැවැත්වීම සඳහා රු.මිලියන 22.3ක් වැයකර තිබුණද 2020 දෙසැම්බර් විගණන දින වන විටත් ආධාර ලබාදීම සඳහා නිර්දේශ වූ ස්වාමීන් වහන්සේලා 30 නමකින් 5 නමක් සඳහා පමණක් රු.376,108 ක් ගෙවීම් කර තිබුණි. | අරමුදල් නිසි පරිදි කළමනාකරණය කර ගෙවීම් කටයුතු කඩිනමින් සිදු කළ යුතු වීම. | 2020 ඔක්තෝබර් 01 දින සිට නිවැරදි යාන්ත්‍රනයක් ඔස්සේ මෙම වැඩසටහනේ ගෙවීම් කටයුතු ක්‍රියාත්මක වන අතර මේවන විට මූලාධාර ගෙවීම් කටයුතු නිවැරදිව සිදුවේ. |
| (ආ) පිළියන්දල ප්‍රදේශයෙහි පිහිටි අමාත්‍යාංශයට භුක්තිය හිමි ඉඩමක පෞද්ගලික ආයතනයක අරමුදල් යොදවා ශාක්‍ය ජනපදය ප්‍රතිනිර්මාණය කිරිමේ ව්‍යාපෘතියක් ආරම්භ කර 2017 මාර්තු 30 දින දෙපාර්ශවය විසින් අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ. | | |
| (i) අදාල ව්‍යාපෘතිය අසාර්ථක වීම හේතුවෙන් එම ඉඩම සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව වෙතපවරා දීමට 2020 නොවැම්බර් 03 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. 2017 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා අමාත්‍යාංශය විසින් ආරක්ෂක හා වෙනත් වියදම් ලෙස රු.11,784,405 ක් ද, විගණනයට | ව්‍යාපෘති ආරම්භ කිරීමේදී හා පවත්වා ගෙන යෑමේදී මනා සැලැස්මක් සහිතව කටයුතු කළ යුතු වීම. | මෙම භූමියේ විශාලත්වය සලකා ආරක්ෂක සේවාව ලබා දීමට තිරණය කර ඇත. 2017 වර්ෂයේ අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුමට අනුව එහි ඉදිරි කටයුතු විධිමත්ව සිදු කිරීමේ ප්‍රමාද දෝෂයක් පවතී. |

| | | |
|---|---|---|
| ලබාගතහැකි වූ තොරතුරු අනුව පෞද්ගලික ආයතනය විසින් රු.51,815,514 ක් ද දරා තිබුණු බැවින් එම වියදම් නිෂ්කාර්ය වියදම් බව නිරීක්ෂණය විය. | | අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රකාරව ඉඩම පැවරීමේ කටයුතු රජයට අවාසිදායක නොවන ලෙස සිදුකිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ii) දෙපාර්ශවය අතර එළඹි අවබෝධතා ගිවිසුමෙහි 10 වන වගන්තිය ප්‍රකාරව අරමුදල් රැස් කිරීම හා වියදම් දැරීම සඳහා රාජ්‍ය බැංකුවක ගිණුමක් විවෘතකර එම ගිණුමේ අත්සන්කරුවකු ලෙස බුද්ධශාසන අමාත්‍යාංශයේ ලේකම් හෝ ඔහු විසින් බලය පවරන ලද නියෝජිතයෙකු නම් කළ යුතු වුවත් එසේ කටයුතුකර නොතිබුණි. තවද, භාර ඔප්පුවෙහි 7A(iii) ප්‍රකාරව පෞද්ගලික ආයතනය විසින් රැස්කරනු ලබන අරමුදල් හා එම අරමුදල් උපයෝජනය කිරීම සම්බන්ධයෙන් ගිණුම් පවත්වාගත යුතු බවත්, 7A(v) ප්‍රකාරව මාසික ව්‍යාපෘති තත්ත්ව වාර්තා සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු බවත් දක්වා තිබුණද ඒ අනුව ද කටයුතුකර නොතිබුණි. එමෙන්ම පෞද්ගලික ආයතනය විසින් රැස්කළ අරමුදල් සම්බන්ධයෙන් හා ඒවා උපයෝජනය කිරීම සම්බන්ධයෙන් ද අමාත්‍යාංශය විසින් විධිමත් පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. | ව්‍යාපෘති ආරම්භ කිරීමේදී හා පවත්වා ගෙන යෑමේදී මනා සැලැස්මක් සහිතව කටයුතු කළ යුතු වීම සහ ගිවිසුම්ගත කරුණු අනුව සිදු වන්නේද යන්න පිළිබඳව නිරන්තර පසුවිපරම් කටයුතු කළ යුතු වීම. | 2017 වර්ෂයේ අවබෝධතා ගිවිමසුම හා භාර ඔප්පුව අත්සන් කළද, එම ගිවිසුමට හා ඔප්පුවට අනුව සිදු කළ යුතු කටයුතු විධිමත්ව සිදු වී නොමැති බව පවතින තොරතුරු ආශ්‍රයෙන් නිරීක්ෂණය විය. |
| (iii) මෙම භූමියෙහි පිහිටි බෝධින් වහන්සේ වටා ඉදිකරන තිබු රන්වැටක් එම ප්‍රදේශයෙහි විහාරස්ථානයක් වෙත ලබා දිමට අමාත්‍යාංශ ලේකම් විසින් 2019 නොවැම්බර් 11 දින අනුමැතිය ලබාදි තිබුණද ස්ථානිය පරික්ෂාව සිදුකල 2020 සැප්තැම්බර් 23 දින වනවිටත් එම රන් ආලේපිත කණු සේවක කාමරයක අනාරක්ෂිත ලෙස තැන්පත් කර තිබුණි. | රන්වැට සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් ලබාදී ඇති අනුමැතිය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | විහාරස්ථානය වෙත රන්වැට ලබා දිමට අමාත්‍යාංශයේ එකඟතාවය ලබා දි ඇත. එය ක්‍රියාත්මක වි නොමැති බව නිරීක්ෂණය වන අතර එය නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. |

| | | |
|---|---|---|
| (iv) COVID-19 වෛරසයට එරෙහි ප්‍රතිශක්තිකරණය වර්ධනය වන ඖෂධයක් නිෂ්පාදනයට අමුද්‍රව්‍ය පෙර සැකසුම් කටයුතු සඳහා මෙම පරිශ්‍රය භාවිතා කිරීම සඳහා පිළියන්දල ප්‍රාදේශීය ලේකම් විසින් 2020 ජුනි 18 දින අමාත්‍යාංශයෙන් අවසර ඉල්ලා තිබුණද  ආගමික කටයුත්තක් නොවන බැවින් ඒ සඳහා අවසර ලබා දී නොතිබුණි. එහෙත්, ස්ථිර වශයෙන් සවිකළ යන්ත්‍රසූත්‍ර කිහිපයක් භාවිතා කරමින් කජු ලෙලි හා කරවල කටු පිළිස්සීමේ කටයුත්තක් සිදු කරමින් පැවති බව 2020 සැප්තැම්බර් සිදුකළ ස්ථානිය පරික්ෂාවේදි නිරීක්ෂණය විය. | අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට කටයුතු කළ යුතු වීම. | අනවසරයෙන් මෙවැනි කටයුත්තක් සිදුවන බවට අමාත්‍යාංශයට තොරතුරු වාර්තා වි නොතිබුණි. |